**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2013**

---

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

2013 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**2.2 ගිණුම්කරණ අඩුපාඩු**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අගය ශූන්‍ය ලෙස දැක්වෙන පිරිවැය රු. 2,874,467 ක වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) මුදල් රෙගුලාසි 104 | මෝටර් රථයක් අනතුරකට ලක්වීම හේතුවෙන් සිදුකරන ලද අළුත්වැඩියාව වෙනුවෙන් රු.1,732,518 ක වියදමක් දරා තිබූ අතර අනතුර සිදුවී වර්ෂ 2කට ආසන්න කාලයක් ගත වී තිබුණ නමුත් අලාභහානිය පිළිබඳව කටයුතු කර රෙගුලාසි ප්‍රකාරව අවසන් වාර්තාවක් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1992 අගෝස්තු 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/92 හා 1994 අගෝස්තු 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/92(1) හා 2002 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 01/2002 | රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නමද සඳහන් කළයුතු වුවත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාහන 06ක් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි |

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කරන තුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වූ අධ්‍යයන හා විධායක තනතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව භාවිතා කරන බඳවාගැනීමේ පටිපාටීන් 2009 වසරේදී වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය විසින් තාවකාලිකව යොදාගෙන තිබුණි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු සඳහා තිබිය යුතු අවම සුදුසුකම් සපුරාගෙන නොතිබූ නිලධාරීන් දෙදෙනෙකු එම තනතුරුවලට අන්තර්ග්‍රහණය කර තිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුගමනය නොකර ආයතනයේ නිලධාරීන් දෙදෙනෙකුට සේවා දිගු ලබා දී ඔවුන්ට වැටුප් වශයෙන් රු. 5,148,000 ක් ගෙවා තිබුණි.

(ඈ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මෝටර් වාහන ආනයනික බලපත්‍ර හිමිනොවන නිලධාරීන් 08 දෙනෙකු සඳහා සහනදායී මෝටර්රථ බලපත්‍ර ලබාදී තිබුණි.

(ඈ) අනුමත නොවූ බඳවාගැනීමේ පරිපාටියකට අනුව අනුමත නොවූ තනතුරකට අදාල සුදුසුකම් නොමැති නිලධාරියෙකු පාලන අධිකාරිය විසින් පත්කර රු.153,720 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඉ) 2011 සිට 2013 දක්වා වර්ෂවලදී ගෙවා තිබූ අධ්‍යයන දීමනාව රු. 7,144,313 ක් හා සමාලෝචිත වර්ෂයේදී ගෙවා ඇති පර්යේෂණ දීමනාව රු. 1,028,475 ක් සඳහා නිසි අධිකාරයක් ලබා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකශන අනුව, ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 3,123,062 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 1,993,820 ක් විය. පෙර වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය රු. 5,116,882 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වෘත්තීය ආචාර්යවරුන් පුහුණු කිරීමේ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ මෙහෙයුම් ලාභය රු. 538,528 ක් වූ අතර ඊට රේඛීය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු රු.3,693,886 ද හේතු වී තිබුණි. එම මුදල් නොලැබුණේ නම් ආයතනයේ ශුද්ධ මෙහෙයුම් අලාභය රු.3,155,358 ක් විය හැකිව තිබුණි.

(ආ) කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය මගින් 2011 අගෝස්තු මාසයේදී රු.5,658,848 ක් වටිනා පරිගණක මෘදුකාංග හා දෘඩාංග විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු නමුත් 2013 වර්ෂය තුළ එයින් ක්‍රියාත්මකව පැවතියේ අධ්‍යාපන කටයුතු සඳහා භාවිතා කරන මෘදුකාංග, සිසුන් ලියාපදිංචි කිරීමේ කටයුතු, විභාග අංශයේ ප්‍රතිඵල නිකුත් කිරීම යන අංශ තුන පමණක් බවත් නිරීක්ෂණය විය.

**4.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනය මිලදී ගත් අරමුණු ඉටු නොකර සමාගම් පනත යටතේ පිහිටුවන ලද පෞද්ගලික සමාගමක් වන තරුණ සේවා සමාගමට ආයතනය සතු රුපියල් මිලියනයක් වටිනා ඩිජිටල් ප්‍රින්ටරයක් ලබාදී තිබුණි.

(ආ) වර්ෂ 2 වැඩිකාලයකට පෙර සේවය හැරගොස් තිබූ නිලධාරියකුගෙන් අයවිය යුතුව තිබූ රු. 134,309 ක මුදලක් හා ආපසු භාරනොදුන් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 05 වෙනුවෙන් අයකර ගතයුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය වත්කම්**

රු. මිලියන 4.7 ක් වැයකර ඉදිකරන ලද උපකුලපති නිල නිවස 2010 මැයි මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ පාරිතෝෂිත/අධිභාර මුදල් ගෙවීම පැහැරහැරීම පිළිබඳ සමාලෝචිත වර්ෂයේදී කම්කරු කොමසාරිස්ගෙන් ලද නියෝගයක් මත ආයතනයේ නිලධාරියෙකුට ගෙවූ අධිභාරය වන රු.18,041 ක් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම, අදාල ක්ෂේත්‍රය ගැන දැනුමක් හා පළපුරුද්දක් ඇති සුදුසු නිලධාරියෙකු මඟින් සිදුකළ යුතු වුවත්, ආයතනයේ ඇස්තමේන්තු පිළියෙල කිරීම, කළමනාකරණ සහකාරවරයෙකු විසින් සිදුකර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 4.3ට අනුව පොලිකාබනේට් වහල සවිකිරීම (Fabrication and Installation of Polycarbonate Roof) සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වඩාත් නිවැරදිව හා ආසන්න වශයෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාළ උපදෙස් ලබාදී තිබුණි. අධි ආතන්‍ය ගැල්වනයිස් පෙට්ටි බාල්ක (Hight tensile galvernized box bars) සැපයීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවට අනුව දික් අඩි 2,475 ක් ඇස්තමේන්තු කර තිබුණද කොන්ත්‍රාත්කරුගේ අවසන් බිලට අනුව දික් අඩි 1,734 ක් යොදාගෙන තිබූ අතර ඒ සඳහා රු. 475,116 ක් ගෙවා තිබුණි. මේ අනුව ඇස්තමේන්තුව සැකසීමේදී දික් අඩි 741 ක් වැඩියෙන් ඇස්තමේන්තු කර ඇති බවත් එය මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30 ක ප්‍රමාණයක් වන බවත් නිරීක්ෂණය විය.

**4.6 විධිමත් පරිදි පවරා නොගත් වත්කම්**

වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාල පනතේ 69(2) (අ) වගන්තියේ විධිවිධාන අනුව වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය පවත්වාගෙන යන ඉඩම විශ්ව විද්‍යාලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

අයවැය ලේඛනය අනුව වැය විෂයයන් 11 ක් සඳහා රු. 7,480,000 ක් ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී කිසිදු වියදමක් දරා නොතිබූ අතර, වැය විෂයයන් 4 ක් සඳහා ඇස්තමේන්තු කර නොතිබියදී සමාලෝචිත වර්ෂයේදී රු.5,207,613 ක් වියදම් වශයෙන් දරා තිබුණි. අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැලකියයුතු වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**5.2 පොදු ව්‍යාපාර කාරක සභාවේ තීරණ**

---------------------------------------

2012 ඔක්තෝබර් 12 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාව දුන් නියෝග අනුව අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා ගෙවන ලද රු.1,683,283 ක දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ලැබිය යුතු ගිණුම්
(ඇ) පාඨමාලා පැවැත්වීම
(ඈ) කාර්ය මණ්ඩල කළමනාකරණ